# කන් ඇසීමේ ප්‍රශ්නයක්ද?

**කන් නොඇසීම හෙවත් බිහිරි බවට කෙනකු උපතින්ම ගොදුරු විය හැකිය. සමහරුනට එම තත්ත්වය ක්‍රමයෙන් ඇතිවේ. කෙසේ වුවද බිහිරි බව ආරෙට යා හැකි රෝගයකි. එනිසා ඒ ගැන අද කාලයේ බෙහෙවින් සැලකිලිමත් විය යුතුය.**

**කන් ඇසෙනවාද?**

දරුවා උපන් මුල් කාලයේම කන් ඇසෙනවාද යන්න ගැන සැලකිලිමත් විය යුතුය. එය අපටම හඳුනාගත හැකියි. දරුවා උපන් මුල් කාලයේ නිද සිටින විට තදින් ඇසෙන ශබ්දයකට ගැස්සේ නම් දරුවාගේ කන් ඇසෙන බවට හඳුනාගත හැකිය. ඉන්පසු මාසයක් පමණ ගිය විට දරුවාට හොඳින් ඇසෙනවා දැයි දැනගත හැක්කේ මෙසේය.

ඒ ළදරුවා තදින් ඇසෙන යම් ශබ්දයකට ඇහුම්කන් දෙන ආකාරය අනුවය. එනම් තදින් ඇසෙන ශබ්දයකට ගැස්සීමෙනි. එවිට දරුවාගේ කන් හොඳින් ඇසෙන බව මවට තේරුම් ගත හැකිය.

දරුවාට වයස මාසය පමණ වන විට හොඳින් කන් ඇසෙන ළදරුවා එම ශබ්දවලට ඇහුම්කන් දෙන බව මවටම වටහා ගත හැකිය. කිරි බොමින් සිටින අවස්ථාවක ශබ්දයක් ඇසෙන විට කිරි බීම නවතා ඊට කන් දීම හෝ වේගයෙන් කිරි බීමට පටන් ගැනීමෙන් දරුවාට හොඳින් ඇසෙන බව මවට තහවුරු කරගත හැකිය.


වයස මාස හතර පමණ වන විට මව කතා කරන හඬ දරුවා හඳුනා ගනී. මව ගේ කට හඬ පමණක් ඇසී මව නොපෙනේ නම් දරුවා හඬයි. එවිට මව පැමිණ කතා කරන විට දරුවා නැළවෙයි. මේ හොඳින් කන් ඇසෙන බුද්ධිමත් ළදරුවෙකි. මාස හත පමණ වන විට දරුවා යම් ශබ්දයක් ඇසෙන විට එම පැත්ත හැරී බලයි.

මාස නවයේදී දරුවාගේ කුස පිරී සතුටින් සිටින විට තමාම යම් ශබ්ද කටින් පිට කරයි. උදාහරණ ලෙස කාර් එකක් යන ශබ්දය 'බබා' වැනි වචන ශබ්ද කරමිනි.

දරුවාට වයස අවුරුද්දක් පමණ වනවිට වචන කිහිපයක් කතා කළ හැකිය. මේ හැර අත්පුඩි ගැසීම 'ටටා' වැනි ශබ්ද කළ හැකිය. මේවායේ අරුත දරුවා නොදනී. එහෙත් ප්‍රීතියෙන් සිටින විට මෙම ශබ්ද පිටකරමින් සතුටු වෙයි.

දැන් දරු පැටියාට වයස අවුරුදු දෙකයි. මෙම වයසට දරුවාට වචන සියයක් පමණ කතා කළ හැකිය. සරල වාක්‍ය කතා කරයි.

ඉහත සඳහන් ලෙසට ඒ ඒ වයසට දරුවාගේ හැසිරීම සිදුනොවන්නේ නම් ඒ කන් ඇසීමේ දෝෂයක් නිසා





■ කොළඹ ජාතික රෝහලේ උගුර කන නාසය පිළිබඳ විශේෂඥ වෛද්‍ය

**චන්ද්‍රා ජයසූරිය**

## ශ්‍රවණ දෝෂ මුලින්ම හඳුනාගන්නේ කොහොමද?

විය හැකිය. අපේ රටේ බොහෝ මවුවරු දරුවාගේ එම අඩුපාඩු හඳුනා ගත්තද වයස අවුරුද්දක් පමණ වන තුරු සායනයට රැගෙන එන්නේ නැත. මෙනිසා බිහිරි බව හඳුනාගෙන ප්‍රතිකාර කිරීම පමා වෙයි.

දරුවා උපන් මුල්ම කාලයේ කන් ඇසෙන බව පරීක්ෂා කිරීමට උපකරණ තිබේ. එනම්, Oto acoustic Emitter සහ Brain stem audiometer ශබ්දයක් ලබාදී ප්‍රතිචාරය පරිගණකය ආධාරයෙන් ලබාගත හැකිය. ඉන්පසු එම පරීක්ෂණයට යොමු කළ ළදරුවාගේ ප්‍රතිචාරය හොඳින් ඇසෙන දරුවකුගේ ප්‍රතිචාරය සමඟ සසඳ බලා ඒ සම්බන්ධව නිගමනයකට එළැඹේ.

සාමාන්‍යයෙන් දියුණු රටවල අලුත උපදින සෑම ළදරුවකුගේම ශ්‍රවණය පරීක්ෂා කරයි. මෙහිදී යම් සැක සහිත බවක් පෙනේ නම් ළදරුවා උගුර කන නාසය ඒකකයට යොමුකරනු ඇත.

මාස හතේදී පමණ දරුවා ශබ්දවලට හොඳින් ප්‍රතිචාර දක්වන විට නැවත ශ්‍රවණ පරීක්ෂණයක් කළ යුතුය. මෙහිදී දරුවන් පරීක්ෂාකර නැවත නොයෙකුත් ශබ්ද ඇතිකර කන් ඇසීමේ මට්ටම නිර්ණය කරනු ඇත.

මෙම මූලික පරීක්ෂණ අසමත් වුවහොත් ඉතා ඉක්මනින්ම දියුණු ක්‍රමවේද භාවිත කර ශ්‍රවණ ඌනතාව තහවුරු කර ගත යුතුය. එවිට හැකි ඉක්මනින් ශ්‍රවණාධාර ලබාදී දරුවා කථන පුහුණුවට යොමු කළ යුතුය. මාසයක් පමණ වයස ළදරුවන්ට වුවද සාර්ථකව ශ්‍රවණාධාර ලබා දිය හැකිය. ශ්‍රවණාධාර මගින් ශ්‍රවණය වැඩි දියුණු කර මාස හයක් තුළ කථනය දියුණු කර ගත හැකිය. එසේ නොවුණොත් කර්ණ සංබ බද්ධය සඳහා දරුවා සූදනම් කළ යුතුය.

මොළයේ සහ කන සම්බන්ධ පටකවල CT හා MRI පරීක්ෂණවලින් කර්ණ සංබය පරීක්ෂා කර මවුපියන් දැනුම්වත් කළ යුතුය. බොහෝ දියුණු රටවල වයස අවුරුද්දක් වන දරුවන්ටද කර්ණ සංබ බද්ධය සිදු කරයි. සැත්කමින් පසු නිසියාකාර කථන පුහුණු ලබා දිය යුතුය. එවිට දරුවාට සාර්ථකව භාෂාව හසුරුවිය හැකියි. එහෙත් මේ සඳහා මවුපියන්ගේ කැපවීම ඉතාම අත්‍යවශ්‍යය. මෙහිදී සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට නම් දිනකට පැය පහක් පමණ දරුවා සමග නොකඩවා කතා කරමින් කාලය ගත කළ යුතුය.

**කර්ණ සංබ බද්ධයට සූදානම් කිරීම**

බද්ධය කිරීම සඳහා රෝගී දරුවාගේ ක්‍රියාකාරී ශ්‍රවණ ස්නායුවක් පැවැතිය යුතුය. සැත්කම කිරීමට තීරණය කිරීමට පෙර අවම වශයෙන් මාස තුනක්වත් ප්‍රසස්ත මට්ටමින් සුසර (Tune) කරන ලද ශ්‍රවණාධාරයක් පැළැඳිය යුතුය.

**රෝගී වීමෙන් ශ්‍රවණාබාධිත වුවහොත්**

දරුවාගේ කන නොඇසීමට හේතුව ආසාදිත රෝගයක් හේතුවෙන් නම් කර්ණසංබය තුළ අස්ථි වර්ධනයක් ඇතිවීමේ අවදානමක් තිබිය හැකිය. මෙය පරීක්ෂා කර බැලිය යුතුය. මෙවැනි තත්ත්වයකදී ශල්‍ය කර්මය හැකි ඉක්මනින් කළ යුතුය.

**කර්ණ සංබයට නුසුදුසු අය කවුද?**

කර්ණ සංබය නිසි ලෙසට වර්ධනය වී නොමැති දරුවන්. පළඳින උපකරණය සැදීමට යොදා ඇති අමුද්‍රව්‍යවලට අසාත්මිකතා දක්වන්නේ නම්,

කන් නොඇසීමට හේතුව ශ්‍රවණ ස්නායුවේ හෝ මොළයේ අක්‍රිය වීමක් නම්,

බාහිර හෝ මැද කනේ ආසාදිත තත්ත්වයක් හෝ ශල්‍යකර්මයකට බඳුන් වන කනේ කන් බෙරය සිදුරුවී ඇති අය.

කන් නොඇසෙන රෝගියා මානසික රෝගයකින් පෙළේ නම් එවැනි පුද්ගලයන් සඳහා කර්ණ සංබ බද්ධය නිර්දේශ නොවේ.

ඉහත සඳහන් හේතුවලට හැර අනෙකුත් ඕනෑම කෙනෙකුට නිසි වෛද්‍ය උපදෙස් මත කර්ණ සංබ බද්ධය කිරීමට පුළුවන.

සටහන - **ශිරානි ගල්ලෑල්ල**